PAFFREL

# ඇල්පිටිය ප්‍රාදේශීය සභා මැතිවරණය පිළිබඳව අන්තර්කාලීන වාර්තාව
# 2024 ඔක්තෝබර් 24

## පසුබිම

2018 පළාත් පාලන මැතිවරණය සඳහා ඇල්පිටිය ප්‍රාදේශීය සභාව සඳහා ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණ ඉදිරිපත් කළ නාමයෝජනා පත්‍රය ගාල්ල දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීවරයා ප්‍රතික්ෂේප කළේය. මෙසේ නාම යෝජනා පත්‍රය ප්‍රතිකේෂේප වූයේ පක්ෂයේ බලයලත් නිලධාරියකු පෞද්ගලිකව නාමයෝජනා පත්‍රය ඉදිරිපත් නොකිරීම නිසාය. මෙම සිද්ධියෙන් පසු එම පක්ෂයේ අපේක්ෂකයින් විසින් මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කරන ලදී.

එහි ප්‍රතිඵලයක් ලෙස ඇල්පිටිය ප්‍රාදේශිය සභාවට අදාළ නඩු කටයුත්ත අවසන් වනතුරු මැතිවරණය පැවැත්වීම වළක්වාලමින් ශ්‍රේෂ්ඨාධිකරණය අතුරු තහනම් නියෝගයක් නිකුත් කළේය. වසරකට පසුව ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ලක් විසින් ඇල්පිටිය ප්‍රාදේශීය සභාව (ප්‍රාදේශීය සභාව) සඳහා වහාම මැතිවරණයක් පවත්වන ලෙස නියෝග කරන ලදී. මීට පෙර ප්‍රතික්ෂේප වූ නාමයෝජනා පත්‍ර භාර ගන්නා ලෙස ද මෙහිදී මැතිවරණ නිලධාරියාට දැනුම් දී ඇත.

2019 ඇල්පිටිය ප්‍රාදේශීය සභා මැතිවරණයේදී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ඡන්ද 23372ක් (56.31%) සහිතව  ආසන 17ක් ලබා ගත් අතර, එක්සත් ජාතික පක්ෂය ඡන්ද 10113ක් (24.37%) ලබා ගත් අතර එක්සත් ජනතා නිදහස් සන්ධානයට 5273ක් (12.71%ක්) සහ ජනතා විමුක්ති පෙරමුණ විසින් ඡන්ද 2435 (5.87%) ලබා ගන්නා ලදී. මෙම මැතිවරණයේ ලියාපදිංචි ඡන්දදායකයින් සංඛ්‍යාව 53384ක් වූ අතර, ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාව  42100 කි. මෙහි වලංගු ඡන්ද සංඛ්‍යාව 41503 (98.58%) ක් වූ අතර, 597 (1.42%) ක ඡන්ද සංඛ්‍යාවක්  ප්‍රතික්ෂේප විය.

ඇල්පිටිය ප්‍රාදේශීය සභා මැතිවරණය 2024 ඔක්තෝම්බර් 26 වැනි දින පැවැත්වෙන බව ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව නිවේදනය කර ඇත. පළාත් පාලන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 වන අධිකාරය) 26 වන වගන්තිය යටතේ ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ සභාපති, උප සභාපති සහ සභිකයින් තෝරා පත්කර ගැනීමට අදාළ ඡන්ද විමසීම සඳහා නාමයෝජනා භාරගැනීමේ දැන්වීම ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී විසින් 2024 අගෝස්තු 26 දින ප්‍රසිද්ධ කරන ලදී. පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් පළමු නාමයෝජනා පත්‍රයේ හා දෙවන නාමයෝජනා පත්‍රයේ නාම යෝජනා කළ යුතු අපේක්ෂකයන් ගණන, පළමු හා දෙවන නාමයෝජනා පත්‍රවලට ඇතුළත් විය යුතු අවම කාන්තා අපේක්ෂිකාවන් ගණන සහ පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් තැන්පත් කළ යුතු ඇප මුදල් පිළිබඳ තොරතුරු අදාළ නාමයෝජනා දැන්වීමේ මෙන්ම ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක 2398/17 දරන 2024 අගෝස්තු 21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේද පළ විය.

පළමු නාමයෝජනා පත්‍රයට අපේක්ෂකයින් 17 දෙනෙකු ඇතුළත් විය යුතුවන අතර, අතිරේක නාමයෝජනා පත්‍රයේ ඇතුළත් විය යුතු අපේක්ෂකයින් ගණන 14කි. කාන්තා නියෝජනයට අදාළව පළමු නාමයෝජනා පත්‍රයේ අපේක්ෂකයින් දෙදෙනෙකු සහ අතිරේක නාමයෝජනා පත්‍රයට අපේක්ෂකයින් 07 දෙනෙකු ඇතුළත් වේ. පළාත් පාලන ආයතනයේ සිටිය යුතු කාන්තා සභික සංඛ්‍යාව 25% ලෙස දක්වා තිබේ. එක් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් නාම යෝජනා කළ යුතු මුළු අපේක්ෂක සංඛ්‍යාව 31 ක් ලෙස දක්වා ඇත.

කෙසේවුවද, ඉදිරි ජනාධිපතිවරණයෙන් පසු ඇල්පිටිය ප්‍රාදේශීය සභා මැතිවරණය 2024 දී පවත්වන බව මැතිවරණ කොමිසම නිල වශයෙන් ප්‍රකාශ කළේය. පිට පිට සිවුවැනි වරටත් අයවැය ප්‍රතික්ෂේප වීමෙන් පසු 2019 නොවැම්බර් මස ආරම්භ වූ ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ නිල කාලය 2024 මාර්තු 06 වැනිදා අවසන් විය. පළාත් සභා පනතට අනුව ඇල්පිටිය ප්‍රාදේශීය සභාව විශේෂ කොමසාරිස්වරයකු යටතට පවරා ගනු ලැබූ අතර, සාමාජිකයින්ගේ කාලය 2024 නොවැම්බර් 04 දක්වා විශේෂ ගැසට් පත්‍රයක් මගින් දීර්ඝ කරන ලදී.

## නාමයෝජනා

2024 ඇල්පිටිය ප්‍රාදේශීය සභා මැතිවරණය සඳහා 2024 සැප්තැම්බර් 09 වැනිදා සිට සැප්තැම්බර් 12 වැනිදා දක්වා ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී නාමයෝජනා භාරගත් අතර, 2024 අගෝස්තු 26 වැනිදා සිට 2024 සැප්තැම්බර් 11 වැනිදා මධ්‍යහන 12:00 දක්වා මැතිවරණ ඇප මුදල් තැන්පත් කිරීමට කාලය ලබා දුණි.

පිළිගත් දේශපාලන පක්ෂ 10ක් සහ ස්වාධීන කණ්ඩායම් දෙකක් විසින් මැතිවරණ සඳහා ඇප මුදල් තැන්පත් කරන ලදී. මේ අතුරින් පිළිගත් දේශපාලන පක්ෂ 09ක් සහ ස්වාධීන කණ්ඩායම් දෙකක් නාමයෝජනා භාරදුන් අතර, දේශපාලන පක්ෂයක සහ එක් ස්වාධීන කණ්ඩායමක නාමයෝජනා ප්‍රතික්ෂේප විය. ඇප මුදල් තැන්පත් කර තිබූ ප්‍රජාතන්ත්‍රවාදී ජනතා කොංග්‍රසය සිය නාමයෝජනා පත්‍ර ඉදිරිපත් කර නොතිබුණි.

පොදුජන එක්සත් නිදහස් සන්ධානය, ජනසෙත පෙරමුණ, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ, දෙවන පරපුර, ජාතික ජනතා පක්ෂය, සමගි ජනබලවේගය, ජාතික ජන බලවේගය, පොදුජන එක්සත් පෙරමුණ, සහ ස්වාධීන කණ්ඩායම 01 යන දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායමේ නාමයෝජනා පිළිගත් අතර, ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂය සහ ස්වාධීන කණ්ඩායම (කේ.ජී. චමින්ද ප්‍රසාද් ප්‍රමුඛ) විසින් ඉදිරිපත් කළ නාමයෝජනා ප්‍රතික්ෂේප කරන ලදී. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් 28 දෙනාගෙන් මන්ත්‍රීවරුන් 17 දෙනෙකු කොට්ඨාශ ක්‍රමයට ඡන්දයෙන් තේරී පත් වන අතර, 11 දෙනෙකු සමානුපාතික නියෝජනයෙන් තෝරා ගැනේ. ප්‍රාදේශීය සභාවට සභිකයින් 28 දෙනෙකු තෝරා පත් කර ගැනීම සඳහා ඡන්ද මධ්‍යස්ථාන 48කදී ඡන්දය ප්‍රකාශ කෙරෙන අතර මැතිවරණය සඳහා අපේක්ෂකයින් 279 දෙනෙකු තරග වදියි.

## ඡන්දදායකයන්ට අදාළ උපදෙස්

මැතිවරණ කොමිෂන් සභාව විසින් 2011 අංක 28 දරන මැතිවරණ (විශේෂ විධිවිධාන) ප්‍රධාන පනතේ 54 (2) වගන්තිය ප්‍රකාරව සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් දෘෂ්‍යාබාධිත හෝ ශාරීරික ආබාධිත පුද්ගලයන් සඳහා ඡන්ද පත්‍රිකාව ලකුණු කිරීමට සහය වීමට වෙනත් පුද්ගලයකු සමග යාමට නීතිමය ප්‍රතිපාදන ලබා දී ඇති බව දැනුම් දී ඇත.

එමෙන්ම පාර්ලිමේන්තු මැතිවරණ පනතේ දහවන උපලේඛනයේ දක්වා ඇති පරිදි සුදුසුකම් පිළිබඳ සහතිකයක් ඡන්ද මධ්‍යස්ථානයේ නිලධාරීන්ට භාර දිය යුතු බව මැතිවරණ කොමිෂන් සභාව විසින් ප්‍රකාශ කළේය.

මැතිවරණ කොමිෂන් සභාව විසින් ශාරීරික ආබාධ සහිත පුද්ගලයින් සඳහා විශේෂ ප්‍රවාහන පහසුකම් සඳහා වන අයදුම්පත පිළිබඳව මාධ්‍ය නිවේදනයක් ද නිකුත් කරන ලදී. අදාළ පළාත් පාලන බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී කාර්යාලවල ඇති අයදුම්පත්‍රයක් හරහා හෝ මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවියෙන් (www.elections.gov.lk) මෙම අයදුම්පත ලබාගත හැකිය.

ඒ අනුව ශාරීරික ආබාධ සහිත පා ගමනින්, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මගින් හෝ ප්‍රාදේශීය ප්‍රවාහන මණ්ඩලයකින් හෝ ශ්‍රී ලංකා රජයේ දුම්රිය මාර්ගයෙන් හෝ සපයන සේවාවකින් ඡන්ද මධ්‍යස්ථානයට යාමට නොහැකි (ශාරීරික ආබාධයක් හේතුවෙන්) ඕනෑම තැනැත්තෙකු හට පනතේ 82 (g) වගන්තිය යටතේ තමා විසින් හෝ ඔහු වෙනුවෙන් අපේක්ෂකයෙකු නොවන වෙනත් අයෙකු විසින්, දිස්ත්‍රික්කයේ තේරීම් භාර නිලධාරියා වෙත ලිඛිතව අයදුම් කළ හැකිය.

මැතිවරණ කොමිෂන් සභාව විසින් 2024/10/07 දින ඇල්පිටිය ප්‍රාදේශීය සභා මැතිවරණයේදී ඡන්දය ප්‍රකාශ කිරීමට සුදුසුකම් ඇති සියලුම ඡන්ද හිමියන්ට සහ තැපැල් ඡන්ද දායකයින් වෙත දැන්වීමක් නිකුත් කරන ලදී. සෑම ඡන්ද දායකයෙකුටම එක් ඡන්දයකට හිමිකම් ඇති බව නිවේදනයේ සඳහන් වේ. එනම් එක් ඡන්ද දායකයෙකුට ලැබෙන්නේ එක් ඡන්ද පත්‍රිකාවක් පමණකි. ඡන්ද මධ්‍යස්ථානයේ ඡන්දදායකයින්ට නිකුත් කරන ඡන්ද පත්‍රිකා මුද්‍රණය කර ඇත්තේ තරග කරන පක්ෂවල නම්, සංකේත සහ "ස්වාධීන කණ්ඩායම" යන වචන සහ ස්වාධීන කණ්ඩායම්වල සංකේත පමණි. ඡන්ද පත්‍රිකාවේ අපේක්ෂකයින්ගේ නම්, අංක හා ආසනය සඳහන් නොවේ.

PAFFREL

**ආදර්ශ ඡන්ද පත්‍රිකාව**

| | | |
|---|---|---|
| “ඒ” පක්ෂය | ◇ | |
| “බී” පක්ෂය | □ | |
| “සී” පක්ෂය | ▱ | |
| ස්වාධීන කණ්ඩායම | □ | |

*ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2024/10/07 දිනැති දැන්වීම අනුව සකස් කරන ලදී*

තමන් ඡන්දය ප්‍රකාශ කිරීමට කැමති දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ නම සහ ලකුණෙහි හෝ අංකය සහ ලකුණෙහි දකුණු පස ඇති ඉඩෙහි “කතිරයක් (X)” පමණක් සලකුණු කරන ලෙස ඡන්ද දායකයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 පරිච්ඡේදයේ) 53A(3) වගන්තියට අනුව ද්විත්ව ඡන්දය ප්‍රකාශ කිරීම වැළැක්වීම සහ විනිවිදභාවය සහතික කිරීම සඳහා ඡන්දදායකයින්ගේ වම් මහපටැඟිල්ල සුදුසු සළකුණකින් ලකුණු කරන බව මැතිවරණ කොමිෂන් සභාව 2024 ඔක්තෝබර් 17 වැනි දින නිවේදනය කළේය. මෑතකදී පැවති ජනාධිපතිවරණයේ ඡන්ද විමසීමේ ක්‍රියාවලියේදී ඇති විය හැකි ව්‍යාකූලත්වයට ප්‍රතිචාර දැක්වීමක් ලෙස මෙය හඳුන්වා දෙන ලදී. ඡන්ද දායකයාගේ වම් මහපටැඟිල්ල නොමැති නම්, එම සළකුණ දකුණු මහපටැඟිල්ලට හෝ අවශ්‍ය නම් වෙනත් ඇඟිල්ලකට උචිත අයුරින් යොදනු ලැබේ.

## තැපැල් ඡන්දය

ඇල්පිටිය ප්‍රාදේශීය සභා මැතිවරණයේ තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීමේ චක්‍රලේඛය 2024/08/26 දින නිකුත් කරන ලදී. මැතිවරණය සඳහා තැපැල් ඡන්ද අයදුම්පත් 2024/08/26 සිට 2024/09/13 දක්වා කාලය තුළ භාර ගන්නා ලදී. තැපැල් ඡන්ද ලැයිස්තු සහතික කිරීම 2024/09/20 දින සිදු කරනු ලැබූ අතර, 2024/09/23 දින තැපැල් ඡන්ද නිකුත් කිරීමේ නිවේදනය නිකුත් කරමින්, තැපැල් ඡන්ද නිකුත් කිරීමේ දිනය 2024/10/07 ලෙස ප්‍රකාශයට පත් කරන ලදී .

ඇල්පිටිය ප්‍රාදේශීය සභා මැතිවරණයේ සියලුම තැපැල් ඡන්ද දායකයින් සඳහා තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීමේ දිනය ලෙස 2024/10/14 දින නියම කළ අතර, එම දිනයේ තැපැල් ඡන්ද ප්‍රකාශ කිරීමට නොහැකිවන අයට 2024/10/18 දින ඔවුන්ගේ සේවා ස්ථාන පිහිටා ඇති දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලදී ඡන්දය ප්‍රකාශ කළ හැකි ලෙස පහසුකම් සැපයිණි.

මැතිවරණය සඳහා තැපැල් ඡන්ද අයදුම්පත් 1576 ක් ලැබී ඇති අතර, පළමු දිනයේ තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීම ඔක්තෝම්බර් 14 වැනි දින සිදු විය. මෙදින තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූවන්ට ඔක්තෝබර් 18 වැනි දිනදී ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ඡන්දය ප්‍රකාශ කිරීමට තවත් අවස්ථාවක් ලබා දුන් බව නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයා විසින් ප්‍රකාශකොට ඇත.

## ඇල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මැතිවරණ වාතාවරණය

ගාල්ල දිස්ත්‍රික්කයේ ඇතැම් වාර්තාකරුවන්ට අනුව, මැතිවරණ ප්‍රචාරණ ව්‍යාපාරය (පූර්ව-මැතිවරණයට කාල සීමාවේ) සමස්තයක් ලෙස සාමකාමීව සිදුවෙමින් පවතින බව පෙනේ. විශේෂයෙන්ම ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ නගරයෙන් පිටත ප්‍රදේශවල දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් හෝ අපේක්ෂකයින්ගේ කටවුට්, බැනර් නොමැති බවත් අපේක්ෂකයින්ගේ කඩදාසි පෝස්ටර් පමණක් තිබෙන බවත් ඔවුන් විසින් වාර්තා කරන ලදී. කෙසේ වෙතත්, එක් දේශපාලන

පක්ෂයක් විසින් මැතිවරණ ප්‍රචාරණ කටයුතු ඉතා උද්යෝගයෙන් සිදු කරන බවක් නිරීක්ෂණයවන බවට තොරතුරු ලැබිණි. සමාජ මාධ්‍යද පසුගිය මාසයේ සිට පැවති ජනපතිවරණය, ඒ ආශ්‍රිත මාතෘකා සහ ලබන මාසයේදී පැවැත්වීමට නියමිත මහා මැතිවරණය සම්බන්ධයෙන් වැඩි අවධානය යොමු කර ඇති බව පෙන්නෙනට ඇති, ඇල්පිටිය ප්‍රාදේශිය සභා මැතිවරණයට මාධ්‍ය අවධානය යොමු වී ඇත්තේ සුළු වශයෙනි.

## නිහඬ කාල සීමාව

නිහඬ කාල සීමාව ආරම්භ වීමට පෙර, ඔක්තෝබර් 21 වැනි දින මැතිවරණයට තරග කරන අපේක්ෂකයකු විසින් පක්ෂ ආධාරකරුවන් සඳහා රැස්වීමක් අවසානයේ භෝජන සංග්‍රහයක් පැවැත්වීමේ සිද්ධියක් වාර්තා විය. මැතිවරණ බලධාරීන්ගේ උපදෙස් මත ඇල්පිටිය පොලීසිය මැදිහත් වීමෙන් මෙම අවස්ථාව නැවැත්වීමට කටයුතුකොට ඇත. මෙම රැස්වීම ඇල්පිටියේ නිවසක සුදානම් කොට තිබූ අතර, ඒ සඳහා පාක්ෂිකයන් 100ක් පමණ සහභාගි වී ඇත. ඇල්පිටිය පොලීසිය විසින් සිදුකළ මෙහෙයුමෙන් අනතුරුව භෝජන සංග්‍රහය සඳහා භාවිතා කළ ද්‍රව්‍ය අත්අඩංගුවට ගෙන ඇත. මෙම සිදුවීමට සම්බන්ධ වී ඇත්තේ කුසලානය ලකුණින් ප්‍රාදේශිය සභා මැතිවරණය සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයෙකුය.

කෙසේ වෙතත්, නිහඬ කාල සීමාවේදී සියලුම අපේක්ෂකයින්, තරග කරන සියලුම පිළිගත් දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් 23/10/2024 දින මධ්‍යම රාත්‍රිය වන විට ඔවුන්ගේ මැතිවරණ ප්‍රචාරක මෙහෙයුම් අවසන් කළ යුතුව තිබුණි. මැතිවරණ කොමිෂන් සභාවට අනුව, මෙම කාල සීමාව මැතිවරණය පවත්වා ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරන තෙක් පවතිනු ඇත.

## පැෆ්රල් සංවිධානයේ මැතිවරණ නිරීක්ෂණ මෙහෙයුම

2024 ඇල්පිටිය ප්‍රාදේශීය සභා මැතිවරණය ප්‍රකාශයට පත්කිරීමෙන් පසු පැෆ්රල් සංවිධානය මැතිවරණ නිරීක්ෂණ මෙහෙයුම ආරම්භ කළ අතර, මෙම මෙහෙයුම ඇල්පිටිය ප්‍රදේශය පුරා මැතිවරණ ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීම වෙනුවෙන් ඡන්ද මධ්‍යස්ථාන 48 ක ස්ථානගත නිරීක්ෂකයින් 46, ගණන් කිරීමේ මධ්‍යස්ථාන නිරීක්ෂකයින් 17 දෙනෙකු (ස්ථානගත නිරීක්ෂකයින් අතරින්) සහ ජංගම නිරීක්ෂක කණ්ඩායම් 02 ක් යෙදවීමට නියමිතය.

**අපව අමතන්න**

නිදහස් සහ සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය (පැෆ්රල්)
අංක 16, බයර්ඩ් පෙදෙස, පාමංකඩ හරස් පාර, කොළඹ 06
දුරකථනය : +94 11 255 8570
වට්සැප් : https://whatsapp.com/channel/0029Va9bCyOLI8YbWO7aaZ0r
විද්‍යුත් තැපැල් ලිපිනය : paffrel@sltnet.lk
ෆේස්බුක්: https://www.facebook.com/Paffrel.Organization
යූටියුබ්: https://www.youtube.com/channel/UCQtjspli-nTqqTC9fq6DcQQ
වෙබ් අඩවිය : https://www.paffrel.com/paffrel/about-paffrel
ටික්ටොක්: https://www.paffrel.com/paffrel/about-paffrel
ඉන්ස්ටග්‍රාම් : https://www.instagram.com/paffrel/
ට්විටර් : https://x.com/PAFFREL
ත්‍රෙඩ්ස් : https://www.threads.net/@paffrel